# නිල්නෙතුගේ සිහිනය



# නිල්නෙතුගේ සිහිනය

කේ.පී.ආශිංසනා සදෙව්දි ගොවින්දකොටුව

# නිල්නෙතුගේ සිහිනය

**(කතා)**

**කේ.ජී.ආශිංසනා සදෙව්දි ගොවින්දකොටුව**

**මහමායා බාලිකා විද්‍යාලය, මහනුවර**

**7 ශ්‍රේණිය** B

2026.06.10

ISBN

# පිළිගැන්වීම

ආදරණීය අම්මාටත්,තාත්තාටත්,

මගේ මේ කුඩා පොත ඔබ දෙදෙනාටම

ආදරයෙන් හා ගෞරවයෙන් පිළිගන්වමි.

මගේ ජීවිතයේ පළමු ගුරුවරුන් හා මඟ පෙන්වන්නන් වූයේ ඔබ දෙදෙනාය.

මගේ සෑම සිහිනයකටම ශක්තිය දුන්නේ ඔබලාගේ ආදරයයි.

අද මේ පොත ලියන්නට හැකිවූයේ ද ඔබගේ ආශිර්වාදය නිසාය.
මාගේ මේ කුඩා උත්සාහය ඔබ දෙදෙනාට සෙනෙහසින් පිළිගන්වමි.

කේ.ජී.ආශිංසනා සදෙව්දි ගෝවින්දකොටුව



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුළු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

## සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ ද දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමගින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,<br>
දියවඩන නිලමේ,<br>
ශ්‍රී දළදා මාලිගාව<br>
2026.05.10

# නිල්නෙතුගේ සිහිනය

එකෝමත් එක කාලෙක නිල්නෙතු කියලා පුංචි ගැනු ළමයෙක් හිටියා. එයා එක්ක ගෙදර හිටියේ අම්මයි, තාත්තයි එයාගේ පුංචි නංගියි. එක දවසක් එයා නංගිත් එක්ක රන්ඩු වෙලා නංගිට ගැහුවා. නංගි අඩනවා දැකලා අම්මා නිල්නෙතුට හොඳටම බැන්නා. ඊට පස්සේ නිල්නෙතුට හොදටම දුක හිතිලා කාමරයට ගිහින් ඇඳට වෙලා කල්පනා කර කර හිටියා.



එකපාරටම නිල්නෙතු ගංඉවුරකින් ඇවිදගෙන යනවා. ලොකු හුලඟක් ඇවිත් එයාව ගඟට වැටුණා. එයා ගඟේ ගහගෙන ගියා. නිල්නෙතු අතු ඉතිවල එල්ලෙන්න උත්සහ කළා. ඒත් එයා ලොකු පල්ලමකට වැටුණා.



ඒත් එයාව වැටිලා තිබ්බේ මල් වත්තකට. ඒකේ ලස්සන පාට පාට මල් වර්ග ගොඩක් පිපිලා තිබුණා. එතන සිංදු කියන කුරුල්ලෝ, ලස්සන සමනල්ලු, හාවෝ වගේ අහිංසක සත්තු ගොඩක් හිටියා. නිල්නෙතු ඒහෙ මෙහෙ දුව දුව සතුටින් මල් එකතු කළා. මල් එකතු කරමින් නිල්නෙතු එතන තිබුණු පොඩි පාරක් දිගේ ඈතට ගමන් කළා.



එහෙම යද්දි නිල්නෙතු හරිම නිස්කලංක ලස්සන පරිසරයක් තියෙන තැනකට ඇවිත් තිබුණා. එතන ලස්සන මාලිගා තියෙනවා. ලස්සන මල් පිපිලා තියෙනවා. නිල්නෙතු කවදාවත් දැකලා නැති ලස්සන සත්තු ගොඩකුත් නිල්නෙතු දැක්කා. නිල්නෙතු ටිකක් ඉස්සරහට ඇවිදගෙන ගියා. එතකොට නිල්නෙතු දැක්කා එයාට අම්මා පොඩි කාලේ කියලා දුන්න සුරංගනා කතාවල හිටිය ලස්සන සුරංගනාවියන් ඉන්නවා. ඉතිං නිල්නෙතුට හරිම සතුටුයි.



එතන හිටිය සුරංගනාවියක් නිල්නෙතු ළඟට ඇවිත් එයාට ආදරෙන් කතා කලා. සුරංගනාවි නිල්නෙතුගේ අතින් අල්ලගෙන මේ ලස්සන පෙන්නන්න එක්කගෙන ගියා. පුදුමයි එහෙ තියන මල්, සත්තු හැමෝම නිල්නෙතු එක්ක කතා කලා. නිල්නෙතුට හරිම පුදුමයි ඒ වගේම හරිම සතුටුයි. ඊට පස්සේ සුරංගනාවිය නිල්නෙතුව එයාගේ මාලිගාවට එක්ක ගියා. නිල්නෙතු දැක්කා එයා කවදාවත් දැකලා නැති කෑම ජාති ගොඩක් තිබුන කෑම මේසයක්. නිල්නෙතු ඒවගේ නමවත් දන්නෙ නෑ. ඉතිං සුරංගනාවි කීවා නිල්නෙතුට ඕනතරම් කෑම කන්න කියලා. නිල්නෙතු කවදාකවත් කාලා නැති රස කෑම ගොඩක් කෑවා. එතකොට නිල්නෙතුට එයාගේ නංගිව මතක් උනා. එයාටත් මේ රස කෑම දෙන්න තිබුනානම් කියලා හිතුනා. එහෙම හිතලා නිල්නෙතු රස කෑම ජාති ටිකකුත් අරගෙන නංගිව හොයන්න එතන තිබුන පාරක් දිගේ ඇවිදගෙන ගියා.



නිල්නෙතු දන්නෙත් නැතිව බය හිතෙන අඳුරු වනාන්තරයකට ඇවිත් තිබුණා. එකේ භයානක සර්පයෝ කොටි වගේ සත්තු හැම තැනම හිටියා. එයාට ගොඩක් බය හිතුණා. එක පාරටම එයාගේ ඉස්සරහට කොටියෙක් ආවා.





ඒ කොටියා එයා ළඟට හෙමින් හෙමින් ළං වුණා. ඒත් එක පාරටම එතනට පැනපු සද්ධන්ත ඇතාට බයේ කොටියා පැනලා දිව්වා. ඊට පස්සේ මේ ඇතා නිල්නෙතුගේ පස්සේ පැන්නුවා. බුද්ධිමත් ළමයෙක් වුණු නිල්නෙතු ගහක් උඩට නගින්න උත්සහ කරද්දී ගහේ තිබ්බ බෙනයකට වැටුණා.



එහෙම වැටුණු නිල්නෙතුට අමුතුම අමුතු ලෝකයක් දැක ගන්න පුළුවන් වුණා. ඒක ගොඩක් රස්නේ ලෝකයක් ගින්දර හැම තැනම තිබ්බා. ලෝදිය වලවල්, කටු ඉඹුල් වගේ භයංකාර දේවල් ගොඩක් තිබ්බා. හරිම නපුරු මිනිස්සු ගොඩක් තවත් මිනිස්සු ඒ භයානක වැඩ වලට ඇඳලා දැම්මා. සමහර මිනිස්සු ලේ පෙරි පෙරි ඒ කටු ඉඹුල් වල නගිනවා. ඒ මිනිස්සුන්ගේ මරලතෝනි වලට නිල් නෙතු හොඳටම බයඋනා. නිල්නෙතුට ඒ මිනිස්සු පවු කියලා හිතුණා. තවත් මිනිස්සු ලෝදිය හැලිවල පැහෙනවා දැක්ක නිල්නෙතු අඩන්න ගත්තා. මේ මිනිස්සු මේ දඩුවම් වලින් බේරෙන්න ගොඩක් උත්සහ කලා. ඒත් එතන හිටිය අමුතු මිනිස්සු ඔවුන් ඒවට ඇදලා දැම්මා මේක දැකලා නිල්නෙතු ගොඩක් බයෙන් වටපිට බල බල එයාගේ අම්මාව හෙව්වා.



නිල්නෙතු දැක්කා අමුතු ඔටුන්නක් ඔළුවට දාගෙන ඉන්න මනුස්සයෙක්ව. එයා හොඳටෝම නපුරු පාටයි. නිල්නෙතු හිතුවා එයා තමා මේ මිනිස්සුන්ගෙ රජ්ජුරුවෝ කියලා. ඒ රජතුමා එක මනුස්සයෙකුට කතා කරලා මොනවදෝ මෙනවදෝ කීවා. ඊට පස්සේ ඒ මනුස්සයා නිල්නෙතු ළඟට ඇවිත් එයාව අල්ල ගත්තා. නිල්නෙතුගේ බය තවත් වැඩි වුනා.

ඒ මනුස්සා නිල්නෙතුව  වලක් ළඟට එක්කගෙන ගියා. නිල්නෙතු බයෙන් කෑගැහගෙන එයාගෙන් බේරෙන්න උත්සහ කළා. ඒත් එයා නිල්නෙතු ඒ වලට  තල්ලු කලා.



නිල්නෙතු බයෙන් ඇස් පියාගෙන අම්මා කියලා හයියෙන් කෑ ගැහුවා. ඒ සද්දෙට අම්මයි නංගියි ඇවිත් බලද්දි නිල්නෙතු ඇඳෙන් බිමට වැටිලා හිටියා. නිල්නෙතු ගොඩක් බයවෙලා ගැහි ගැහි බලාගෙන ඉන්නවා. නිල්නෙතුට එතකොට තමයි හිතුනේ එයා මෙච්චර වෙලා දැකලා තියෙන්න් හීනයක් කියලා.



එයාගේ නංගිට දැන් රණ්ඩුව මතක නෑ. එයා දැකපු හීනේ අම්මටයි නංගිටයි කිව්වට පස්සේ එයාලා පුදුම උනා. ඊට පස්සේ නිල්නෙතුගේ අම්මා කිව්වා කවදාවත් තරහින් නිදියන්න හොඳ නෑ කියලා. එදායින් පස්සේ නිල්නෙතු නංගිත් එක්ක තරහා උනේ නෑ. ඒ දෙන්නා සතුටින් එකතු වෙලා සෙල්ලම් කළා.

# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදී ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලමේ තුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)

**නම**

කේ.ජී.ආශිංසනා සදෙව්දි ගෝවින්දකොටුව

**පන්තිය**

7 – B

**පාසල**

මහමායා බාලිකා විද්‍යාලය , මහනුවර

**පොතේ නම**

නිල්නෙතුගේ සිහිනය

**පන්තිභාර ගුරුතුමියගේ අත්සන**

.................................................

**අංශභාර ගුරුතුමියගේ අත්සන**

...................................................